# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 8 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 මාර්තු මස 07 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 8 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 37/72.

## 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 8 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඩු නාමය.**

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1957 අංක 48 දරණ මෝටර් ගමනාගමන පනතෙහි 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතෙහි 28අ වන වගන්තිය වශයෙන් බල පැවැත්වේ:— 1957 අංක 48 දරන පනතෙහි 28අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ණයට ගත් මුදල් ආධාර මුදල් බවට පරිවර්තනය කිරීමෙන් පසු, ඒවා ලංකා ගමනාගමන මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් සැලකිය යුතු බව.

28අ. (1) 28 වන වගන්තිය යටතේ 1974 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ආණ්ඩුවෙන් ණයට ගත් යම් මුදලක් අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව එම මණ්ඩලය විසින් ඉල්ලුම් කළ විට ආධාර මුදල් බවට පරිවර්තනය කිරීමට මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබිය හැකිය. එකී පරිවර්තනය ඒ මුදල ණයට ගනු ලැබූ දිනයේ සිට හෝ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පසු දිනයක සිට හෝ බලපැවැත්වෙන සේ එකී පරිවර්තනය කිරීමට බලය දෙනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආධාර මුදල් බවට පරිවර්තනය කරන ලද මුදල්වල සමස්තය ලංකා ගමනාගමන මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධනය ලෙස සලකනු ලැබේ.".

2—ඒ 09884—9,691 (75/3)

අතීතයට බලපෑම.

3. 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරන ලද 28අ වන වගන්තියෙහි විධිවිධාන ඒ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයේ සිට වලංගු වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28ආ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි (මේ පනතේ 2 වන වගන්තිය මගින් ඇතුළත් කරන ලද) 28අ වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියෙහි 28ආ වන වගන්තිය වශයෙන් බලපැවැත්වේ :—

"ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාග්ධනය කලින් කල වැඩි කළ හැකි බව.

28ආ. ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාග්ධනය විසර්ජන පනතක් මගින් හෝ ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරනු ලැබූ යෝජනාවක් මගින් හෝ බලය දෙනු ලබන මුදල් ප්‍රමාණවලින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි අතර, එකී මුදල් ප්‍රමාණ, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් නියමයන් හා කොන්දේසි පිට, ආණ්ඩුව විසින් ආධාර මුදල් වශයෙන් හෝ ණය මුදල් වශයෙන් ලංකා ගමනාගමන මණ්ඩලයට දීම හෝ එකී මණ්ඩලයට ලබාදීමට සැලැස්වීම හෝ කරනු ලැබිය යුතුය.".